Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# මහරගම නගර සභාව

මහරගම නගර සභාවේ පුරප්පාඩුව පවතින බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම් කිරීමට සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාතේ පදිංචි පුරවැසියන් වෙතින් අයදුම්පත් 2019.12.25 වන දින දක්වා භාර ගනු ලැබේ.

අයදුම්පත්, "ලේකම්, මහරගම නගර සභාව, මහරගම" යන ලිපිනයට 2019.12.25 වන දින දහවල් 12.00ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස උඩු කෙළවරේ තනතුරු නාමය සඳහන් කළ යුතු අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| | | |
|---|---|---|
| 01. | තනතුර හා වැටුප් පරිමාණය : | |
| | පැස්සුම්කරු - 01 | රු. 25,250 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 |
| | ජල පොම්ප ක්‍රියාකරු - 01 | රු. 25,250 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 |
| | ආදහනාගාර ක්‍රියාකරු - 01 | රු. 25,250 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 |
| | විදුලි කාර්මික - 01 | රු. 25,250 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 |
| | සෞඛ්‍ය කම්කරු - 01 | රු. 24,250 - 10 x 250 -10 x 270 - 10 x 300 - 10 x 330 - රු. 36,410 |
| | | |
| 02. | බඳවා ගන්නා ශ්‍රේණිය | III ශ්‍රේණිය |
| | | |
| 03. | අධ්‍යාපන සුදුසුකම් : | |
| | ජල පොම්ප ක්‍රියාකරු<br>පැස්සුම්කරු<br>විදුලි කාර්මික | අ.පො.ස.(සා. පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06 සමත්වීම (මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය.) |
| | ආදහනාගාර ක්‍රියාකරු<br>සෞඛ්‍ය කම්කරු | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. |
| | | |
| 04. | වෘත්තීය සුදුසුකම් : | |
| | ආදහනාගාර ක්‍රියාකරු<br>පැස්සුම්කරු<br>ජල පොම්ප ක්‍රියාකරු<br>විදුලි කාර්මික | අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම. |
| | සෞඛ්‍ය කම්කරු | අදාළ නැත |

| | | |
|---|---|---|
| 05. | පළපුරුද්ද : | |
| | ආදහනාගාර ක්‍රියාකරු | අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් මාස 06 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. |
| | ජල පොම්ප ක්‍රියාකරු | |
| | පැස්සුම්කරු | |
| | විදුලි කාර්මික | |
| | සෞඛ්‍ය කම්කරු | අදාළ නැත |
| | | |
| 06. | සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි | (i) මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.<br>(ii) වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා දායක විය යුතුය. (ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතු වේ.)<br>(iii) මෙම තනතුර වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ. |
| 07. | වෙනත් සුදුසුකම් | (i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම<br>(ii) සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br>(iii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු වීම<br>(iv) යහපත් චරිතයකින් යුක්ත වීම<br>(v) මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් සම්පූර්ණ කර තිබීම. |

08. වයස් සීමාව : අයදුම්පත් කැඳවන දිනට අවුරුදු 18ත් 45ත් අතර විය යුතුය.

09. බඳවා ගැනීමේ ක්‍රමය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

(iii) ආදහනාගාර ක්‍රියාකරු, ජල පොම්ප ක්‍රියාකරු, පැස්සුම්කරු, විදුලි කාර්මික

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ දී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතර ලබා ඇති සුදුසුකම් | 20 | 50% |
| සාමාන්‍ය දැනුම | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

සෞඛ්‍ය කම්කරු :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම් , ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 5 බැගින්) | 15 | |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

10. ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද/මුදල් රෙගුලාසිවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලටද, පළාත් පාලන ආයතනවලට අදළ ආඥා පනත්වල විධිවධාන වලටද, මහරගම නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝගවලටද අනුකූලව කටයුතු කළ යුතුය.

11. මෙම තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ බඳවා ගැනීම හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල මහරගම නගර සභාවේ ලේකම් සතුය.

එස්. ඒ. කේ. කේ. ඉන්ද්‍රජිත්,
ලේකම්,

2019 නොවැම්බර් මස 21 වන දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා

**ආදර්ශ අයදුම්පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල............................තනතුර සඳහා අයදුම් පත්‍රය***

01. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

02. මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්) :
..........................................................................................................................
..........................................................................................................................

03 මුලකුරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

04. (i) ස්ථිර ලිපිනය (සිංහලෙන්) :
....................................................................................................................................
....................................................................................................................................

(ii) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | |

(iii) තාවකාලික ලිපිනය (සිංහලෙන්) :
....................................................................................................................................
....................................................................................................................................

05. උපන් දිනය : අවුරුද්ද: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

06. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු: ☐☐ මාසය ☐☐ දින: ☐☐

07. ජාතික හැඳුනුම්පත් අංකය: ☐☐☐☐☐☐☐☐☐☐☐☐
(උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් ඇමිණිය යුතුය.)

08. විවාහක/අවිවාහක බව:―――――――――――

09. දුරකථන අංක : පෞද්ගලික:―――――――――――

10. බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කාල සීමාව:―――――――――――
(ග්‍රාම සේවා සහතිකය මගින් සනාථ කළ යුතුය.)

11. අධ්‍යාපන සුදුසුකම් :
....................................................................................................................................
....................................................................................................................................
(සුදුසුකම් සහතික කිරීමට අදාළ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

12. පළපුරුද්ද :
....................................................................................................................................

13. වෙනත් සුදුසුකම් (ක්‍රීඩා හා වෙනත්) :
....................................................................................................................................
....................................................................................................................................
(සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සහතික කළ ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

14. (i) ඔබ කිසියම් සාපරාධී වරදක් සම්බන්ධයෙන් කෙදිනකදී හෝ උසාවියක දී වරදකරු වී තිබේද? (ඔව්/නැත)
(ii) ඔබගේ පිළිතුර ඔව් නම් වරදේ ස්වභාවය හා දඬුවම කුමක්ද ?
....................................................................................................................................
....................................................................................................................................

ඉහතින් මා විසින් සඳහන් කරන ලද කරුණු මාගේ දැනීමේ හා විශ්වාස පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටින අතර, කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන වල ...................... ............. III වන ශ්‍රේණියේ තනතුරකට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා ............................III වන ශ්‍රේණියේ තනතුරකට නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව සේවයෙන් පහ කළ හැකි බවත් මා දනිමි.

............................
අයදුම්කරුගේ අත්සන.

දිනය :............................